ස්නානය කිරීමෙන් පසු කපිල අචලා සමඟ තේ මේසයට වාඩිවිය. "කොහොමද අචලා, ඔයාට දැනට අසනීපයක් එහෙම නැහැ නේද" කපිල පුරුදු ලෙස ඇසුවේය.

"නැහැ කපිල අමාරු ගතියක් නැහැ; කොහොමද අර අපේ ගමේ ලෙඩාට?"

"තාම කියන්ට බැහැ කකුලේ තත්වය මොන අතට හැරෙයිද කියලා.. මිනිහගේ නම විමුක්ති පියරත්න.. ඔයාගේ ගමේ කෙනෙක් නිසා මම මතක තියා ගත්තා"

මෙය ඇසූ අචලාගේ හර්ද ස්පන්දනය වැඩිවිය. සිතෙහි හටගත් සංවේගය කපිලට නොදැනෙන සේ, අසුනින් නැගිට්ටාය. තම ශෝකය යටපත් කර ගැනීමට අචලා නොයෙකුත් වැඩවල යෙදෙන්නට පටන් ගත්තාය. විමුක්ති ගැන සිතමින් දුක් වීමෙන්වත්, තමන්ට පලක් නොවන බව අචලාට අවබෝධ විය.

මානුෂික හැඟීම් වලින් ඇයට බේරීමක් නැතිවිය. කිසිම වෙනසක් නොපෙන්වා සිටිමට අචලා සෑම විටම උත්සාහ කළාය. නැවත වරක් මේ ලෙඩා ගැන නොඅසා සිටිමට ඇය වෑයම් කළාය. රාත්‍රි භෝජනයෙන් පසු, ඔවුහු පුරුදු ලෙස රූපවාහිණි වැඩසටහන් කීපයක් බලා, නින්දට ගියෝය.

සයුරි රංගන හා විවාහ වුවාය. මේ කාලසීමාවේ අචලා තම නිවසේ සතියක් පමණ ගත කළාය. ඇය තම නැගණියට උදව් වුවාය. විමුක්ති තම නිවසේ සිට සිංහල වෙදකම් කරන බවත්, ඔහු ඉතාමත් අසරණ තත්වයකට වැටී සිටින බවත්, නැගණියගෙන් දැනගත්තාය.

කාලය ගෙවී ගියේය. අචලාගේ දියණියට දැන් අවුරුදු 4 කි. විමුක්ති සිංහල ප්‍රතිකාර වලින් සම්පූර්ණ සුවය ලබා නැවත ගුරුකම කරගෙන යන්නේය. රංගන හදිස්සියේ ඇති වූ හර්ද රෝගයකින් මිය ගියේය. සයුරිගේ ජීවිතය නොසිතූ ලෙස කඩා වැටුනේය. යහලුවකු බැලීමට රෝහලට යද්දී, සයුරිට විමුක්ති මුණගැසුණි. ජිවිතයේ නොසිතූ ලෙස අසරණ වූ සයුරි කෙරෙහි විමුක්තිට ඇතිවුයේ බලවත් දුකකි. ඔහු ඇය සැනසීමට ටික වේලාවක් ඇය හා කතා කරමින් සිට ආ පසු ගියේ, නැවත ඇය හමුවීමට එන බලාපොරොත්තුව ඇතිවය. සයුරි තමාට නැගණියකි. මෙතරම් තරුණ කාලයේ, ඇයට සිදු වූ මේ ව්‍යසනයෙන් ඇය කොතරම් අසරණ වුයේ දැයි ඔහු කල්පනා කළේය. වේලාව ලත් සෑම විටම ඔහු සයුරි බැලීමට ඇයගේ නිවසට ගියේය. සයුරිගේ දෙමාපියන්ටද, විමුක්ති තමාගේ අයට මෙන් කරුණාවන්ත වුවේය. මේ ගමන් වලදී, සයුරිගේ මවට හා පියාට යමක් ගෙන ඒමට විමුක්ති අමතක කලේ නැත. කාලය මෙසේ ගෙවී යද්දී සයුරිගේ සිතෙහි විමුක්ති කෙරෙහි යම්කිසි ලෙන්ගතු කමක් ඇති වී තිබෙව බව බොහෝ විට ඇය, ඔහු ගැන මෙනෙහි කිරීමේදී වැටහි ගිය වාර අනන්තය. එහෙත් ඇයට මේ සම්බන්දව කිසිවක් ඔහුගෙන් ඇසිය නොහැක.

එදා සෙනසුරාදාවකි. සයුරිට නිවාඩු දිනයකි. හවස 5.30 ට පමණ, විමුක්ති පුරුදු ලෙස සයුරිගේ නිවසට ගොඩවුයේ "අද හොඳ ආරංචියක් ගෙනාවා" කියමිනි.

"එන්න අයියා ගෙට, තේ එකක් එහෙම බීලා ආරංචිය දැන ගමුකො" සයුරි කීවාය.

"මම අයියාට වැලිතලප හැදුවා, අයියා ඒවා කන්ට කැමතියිනේ,"
"ඔයා කොහොමද මං කැමති දේ දන්නේ?"

මම දන්නවා සයුරි දඟකාර ලෙස උත්තර දුන්නාය.

විමුක්ති වැලිතලප කෑමට කැමති බව දන්නේ අචලාය. බොහෝ විට අචලා, විමුක්තිට වැලිතලප සාදා ගෙනවිත් දුන් අයුරු ඔහු මතකයට අවේය. සිහින් වේදනාවක් ඇති වුවත්, ඔහු එය අමතක කර දැමීය.

තේ පැන් සංග්‍රහයෙන් පසු, "ඉතින් කියන්නකෝ, ආරංචිය "අයියේ"

"ආරංචියක් නෙවෙයි සයුරි, මේක යෝජනාවක්"
"යෝජනාවක්? ...කාගෙන්ද? ඔයාගෙන්ද?"

"අනේ නැහැ සයුරි නංගි, මේ යෝජනාව මගේ හොඳම යාලුවා සුගත්ගෙන්."

"මොකක්ද අයියේ යෝජනාව?" සයුරි සසලවූ සිතින් ගොත ගසමින් ඇසුවාය.
"මංගල යෝජනාවක් ඔයාට"

තමන් නොසිතූ දෙයක් මෙලෙස විමුක්තිගේ මුවින් පිටවීම සයුරිට දැරිය නොහැක්කක් විය. ඇය බිම බලාගත්වනම සිටියා මිස, කිසිම පිළිතුරක් නොදුන්නාය. සිත තුළ ගොඩ නැගී තිබූ දහසක් මාළිගා කඩා වැටුණාසේ ඇයට දැණිනි. දෑසින් කඳුලු කැට කඩා හැලෙන්නට විය. විමුක්තිගේ සිත සසලවී ගියේය. තමා යෝජනාවක් ගෙන ඒමෙන් කලේ බලවත් වරදකැයි ඔහු සිතුවේය.

"අනේ සයුරි මට සමාවෙන්න, මම මේ ගැන වැඩිය හිතුවේ නැහැ. මට ඕනෑ කරේ ඔයාගේ පාලුව මකන්ට හොඳ කෙනෙක් හොයා දෙන්ටයි. හිත රිදෙව්වට මට සමාවෙන්ට.

"විමුක්ති අයියේ... මේ යෝජනාව ඔයාගෙන් උනානම් අද මම කොයි තරම් සතුටු වෙනවද... ඒත්"

ඇය කඳුලු පිසදමමින් මුමුනන්නට වුවාය.

මෙය ඇසූ විමුක්ති විශ්මයට පත්විය. සයුරි කෙරෙහි අනුකම්පාවක් මිස, ආදරයක් ඔහුගේ සිතේ ඇතිවී තිබුනේ නැත. අචලාට ආදරය කල විමුක්ති, කෙසේ නම් සයුරිට ආදරය කරන්ටද? එය කිසිසේත් කල නොහැකි බව ඔහුගේ සිත කියන්නට විය.

"මගේ නංගි, මේ දේ මට කොහෙත්ම කරන්ට බැරි බව ඔයා දන්නවානේද? ඔයා මට මගේම නංගි."

කාලය ගෙවී යද්දී, සයුරි විමුක්ති ගෙන ආ යෝජනා-වට කැමති වුවාය. විමුක්ති තමාට යහපතක්ම කරන බව සයුරි එක සිතින්ම විස්වාස කළාය.
දෙමාපියන්ගේද ආශිර්වාදය ඇතුව, සයුරි සුගත් හා අතිනත ගත්තාය.

සවස් යාමයේ පන්සලේ ලොකු ස්වාමීන් වහන්සේ මුණගැසී කතා කරමින් සිටීම විමුක්තිගේ සිතට සහනයක් ගෙන දුන්නේය. පන්සලේ හොඳ දායකයකු වූ විමුක්ති, ඉඳහිට සයුරිගේ දෙමාපියන්ට ධර්ම පොත් ගෙනත් දීමට අමතක නොකලේය.

මේ පොත කියවා අපසු බාර දෙනවිට, දෙමාපියන් විමුක්තිට පිං ප්‍රාර්ථනා කලෝය. "රේණුකාගේ චන්ද විමල ස්වාමින්වහන්සේ ගේ පොත කියවීමට විමුක්ති ඉතාම කැමැත්තක් දැක්විය. ජිවිතයේ නිස්සාර භාවයත්, සැනසීම ලබා ගත හැකි මාර්ගයත් බුදු රජාණන් වහන්සේ දෙසූ සුත්‍රත් කියවීමෙන්, විමුක්ති අසීමිත සුවයක් වින්දේය.

දැන් අචලාට දරුවන් තිදෙනෙක් සිටින්නීය. වැඩිමල් දියණියට අවුරුදු 15 කි. සයුරිට දරුවන් දෙදෙනෙකි. මේ පවුලේ ඉතාමත් සාමකාමී දිවියක් ගත කරන අතර දෙමාපියන්ද තාම නිරෝගී සුවයෙන් පසුවන්නේය.

විමුක්ති ලොකු ස්වාමීන් වහන්සේ යටතේ මහණ දම් පුරා, ඈත ආරණ්‍යයක වැඩ විසීය.

විමුක්ති වන් පුතකු ලැබීම, දෙමාපියන්ට මොන සතුටක්ද? ඒ සතුට විඳීමට අද ඔවුන් ජිවතුන් අතර නැතත්, සංසාරයේ කොතැනක හෝ සිට සතුටු වනවා ඇත. ■


Well experienced teacher at Noble Park offers tution in

**MATHEMATICS AND SINHALESE**

to 1-8 level students.

**Contact : Shirley**

**9546 0979 or 0421 903 572**



# Closing down Sale

From 15th December

## සියළුම භාණ්ඩ ඇදහිය නොහැකි මිලකට

Tropical Island

Sri Lankan Grocery Store

15 Nepean Street

Broadmeadows Vic

Melway 6K10



**ABN 399 885 48425**

# SRI WRECK TOWING



**VEHICLE TRANSPORT**
**BREAKDOWNS**
**FREE OLD CAR REMOVALS**
**RELIABLE RATES**
**TILT TRAY TRUCK**
**ALL AREAS**

24 hours 7 days a week

**0433 495 548**

**udesha@bigpond.com Tel 5995 6105**